# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2253/29 - 2021 නොවැම්බර් මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2021.11.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/22/11/2010.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.08.26 දිනැති හා අංක 2138/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.08.20 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කටාන, බටහිර කලුවාරිප්පුව, අංක 86 එෆ් හි පදිංචි කේ. එස්. මුණසිංහ මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2021.04.01 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 ඔක්තෝබර් මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික බේරුම්කරණයේ දී ය.

බේරුම්කාර ඕබඩගේ ලීලාරත්න මැතිතුමා ඉදිරිපිට දීය.

කේ. එස්. මුණසිංහ මහතා,
අංක 86 F,
බටහිර කලුවාරිප්පුව,
කටාන.

ආරවුල් අංකය : IR/22/11/2010.
බේරුම්කරණ නඩු අංකය : A/90/2019

*පළමු පාර්ශ්වය*

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

*දෙවැනි පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරවුල
පෙනී සිටීම-
පළමු පාර්ශ්වය වෙනුවෙන්-
නියෝජිත පී. එම්. තිලකසිරි මහතා
දෙවැනි පාර්ශ්වය වෙනුවෙන්-
ආයතනයේ නීති නිලධාරිනී නදීෂා අමරතුංග මහත්මිය
රජයේ නීතිඥ සාලින්ද කුරියන් මහතා

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.


1 A – G 35319 — 31 (2021/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණය සඳහා යොමුකර ඇති කාර්මික ආරවුලට හේතුවී ඇති කරුණ වනුයේ ''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මීගමුව ඩිපෝවට අනුයුක්තව සේවය කරමින් සිටිය දී 2008.11.17 දින සිට කේ. එස්. මුණසිංහ මහතාගේ වැඩ තහනම් කිරීම සම්බන්ධයෙන් ගම්පහ ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ විනය නිලධාරීන්ගේ විනය නියෝගය හා අනතුරුව එහි අභියාචනා මණ්ඩල සභාපති ගේ අභියාචනා නියෝගය හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම් ඔහුට කුමක් හිමි ද යන්න පිළිබඳව වේ.''

මේ සම්බන්ධයෙන් දෙපාර්ශ්වයේ පළමු ප්‍රකාශ බේරුම්කරණය වෙත ගොනු කිරීමෙන් අනතුරුව 2021 ජනවාරි මස 26 වැනි දින දෙපාර්ශ්වය කැඳවා බේරුම්කරණ නඩුව ආරම්භ කරන ලදී. මෙහි දී දෙවන පාර්ශ්වය වෙනුවෙන් රජයේ නීතිඥ සාලින්ද කුරියන් මහතා ඉල්ලා සිටියේ මෙම බේරුම්කරණ නඩුව මීට ඉහත අවස්ථා කිහිපයකදීම බේරුම්කරුවන් කිහිපදෙනෙකු යටතේම විභාගයට ගැණුන අතර, අවසාන වශයෙන් බේරුම්කරණ නඩු අංක 3669 යටතේ පී. දනන්සූරිය මහතා විසින් විභාග කර බවත් එම බේරුම්කරු විසින් විභාගකර නැවැත් වූ තැන සිට මෙම නඩුව ගෙන යන්නේ නම් එය දෙපාර්ශ්වයටම පහසුවක් වනු ඇති බවයි.

මේ සම්බන්ධයෙන් පළමු පාර්ශ්වයේ නියෝජිත තිලකසිරි මහතා පවසා සිටියේ මෙම බේරුම්කරණ නඩුව වසර 14ක පමණ කාලයක් තිස්සේ බේරුම්කරුවන් කිහිපදෙනෙක් යටතේ විභාග වීමට යොමුකර තිබුණද ඒ කිසිම බේරුම්කරුවකු මෙම නඩුව අවසානවන තෙක් අසා නොතිබූ බවත්, අවසාන වශයෙන් මෙම බේරුම්කරණ නඩුව විමසීම කරනු ලැබූ බේරුම්කරු දනන්සූරිය මහතා ඉදිරියේ සිදු කරන ලද මෙම පරීක්ෂණයේ දී මෙම ඉල්ලුම්කාර සේවකයාගෙන් නැවත ප්‍රශ්න ඇසීමට තිබූ බැවින් එතැන සිට මෙම බේරුම්කරණ නඩුව ඉදිරියට ගෙන යාම සම්බන්ධයෙන් තම සේවාදායකයා විරුද්ධ නොවන බවත් එබැවින් නඩුව කලින් බේරුම්කරණයේ අවසන් කර තැන සිට ආරම්භ කරන මෙන් ද ඉල්ලා සිටින ලදී.

මෙම ආරවුල දිගු කාලයක් තිස්සේ පැවත එන්නක් බැවින් හා එය සේවක පාර්ශ්වයට දැඩි අසාධාරණයක්වන අතර සේවා යෝජක පාර්ශ්වයට ද අහිතකර තත්ත්වයක් බව දෙපාර්ශ්වයටම අවබෝධකර දීමෙන් අනතුරුව මෙම ආරවුල සම්බන්ධයෙන් යම් සමථයක් ඇති කර ගැනීමට ඇති ඉඩකඩ ගැන ඉහළ කළමණාකාරිත්වය සමග සාකච්ඡාකර මෙම බේරුම්කරණය වෙත දන්වා සිටින ලෙසට දෙවැනි පාර්ශ්වයට දැනුම් දුන්නෙමි.

එහි දී පළමු පාර්ශ්වය විසින් තමන්ගේ සේවය තහනම් කර තිබූ කාලයට නොගෙවන ලද අඩ වැටුප ගෙවන්නේ නම් මෙම ආරවුල සමතයකට පත්කර ගත හැකි බව දැනුම් දෙන ලදුව දෙවැනි පාර්ශ්වය විසින් එම සමත යෝජනාව කළමණාකාරිත්වයට දැනුම් දීමෙන් පසුව ඒ සම්බන්ධ දෙවැනි පාර්ශ්වයේ ස්ථාවරය මෙම බේරුම්කරණය වෙත දැනුම් දෙන බව දැනුම් දෙන ලදී.

ඉන් අනතුරුව 2021.03.24 වැනි දින නැවතත් දෙපාර්ශ්වය කැඳවූ අවස්ථාවේ දී දෙවැනි පාර්ශ්වය දැනුම් දෙනු ලැබුවේ මෙම ඉල්ලුම්කරුවෙත ඔහු වැඩ තහනමට ලක්කරන ලද කාලය වෙනුවෙන් නොගෙවන ලද අඩවැටුප් අහිමි කරනු ලැබුවේ විධිමත් විනය පරීක්ෂණයක් සිදුකිරීමෙන් අනතුරුව ඉන් ලබා දෙනු ලැබූ නිර්දේශ මත ඔහුට දඬුවමක් ලෙසට බවත්, එසේ අහිමි කරන ලද අඩවැටුප ලබාදිය හැක්කේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථාවේ 18 වගන්තියේ පරිදි චෝදනාවලින් නිදහස් වුවහොත් පමණක් බැවින් එසේ අහිමි කරන ලද අඩවැටුප් ගෙවීමට නොහැකි බවත්, එහෙත් මෙම බේරුම්කරණ නඩුව සඳහා ගතවී ඇති කාලය සලකා බලා පළමු පාර්ශ්වයේ සේවකයාහට යම් සාධාරණ මුදලක් සානුකම්පිත දීමනාවක් ලෙස ගෙවීමට හැකියාව ඇති බව ද ප්‍රකාශ කරන ලදී. තව ද, මේ සම්බන්ධයෙන් ගමනාගමන මණ්ඩලයේ නීති උපදේශක විසින් කරන ලද නිර්දේශය ආයතනයේ සභාපතිවරයා විසින් අනුමත කර ඇති බව ද දන්වා සිටින ලද අතර, මෙය වෙනත් පාර්ශ්වයකට උදාහරණයක් නොවන ලෙසට මෙම බේරුම්කරණය අවසන් කිරීම සඳහාම පමණක් ගෙවනු ලබන සානුකම්පිත දීමනාවක් බවත්, මේ සම්බන්ධයෙන් අවසාන සමතයක් ලෙසට සානුකම්පිත ගෙවීමක් ලෙස රුපියල් තිස්පන්දහස (රු. 35,000) ක මුදලක් පමණක් ගෙවීමට හැකි බවත් ගරු බේරුම්කරණය වෙත දැනුම් දෙන ලදී.

ඒ අනුව කරුණු දක්වූ පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුගේ නියෝජිත තැන පවසා සිටියේ මෙම ආරවුල සම්බන්ධයෙන්වන අහිමි කරන ලද අඩවැටුප ලබා ගැනීමේ හිමිකම විනය ව්‍යවස්ථා මාලාවේ 6.1 අනුව සේවකයාට හිමිකම ඇති බවත්, එහෙත් මෙම ආරවුල 2008 සිට අද දක්වාම විවිධ බේරුම්කරුවන් ඉදිරියේ දිගින් දිගටම නොවිසඳී පැවතීම යන කරුණ පිළිබඳව සලකා බලා සහ ඉල්ලුම්කරුගේ මානසික තත්ත්වය ද සලකා බලා මෙම සමතයට එකඟවීමට තම සේවාදායකයා කැමතිවන බව තමාට දැනුම් දුන් බව ද ඒ අනුව මෙම සමතයට පළමු පාර්ශ්වයේ එකඟතාවය පල කරන බව ද, දැනුම් දෙන ලදී.

ඒ අනුව පහත සඳහන් ප්‍රදානය මා විසින් ප්‍රකාශ කර සිටිමි.

### ප්‍රදානය

මෙම සේවකයාගේ සමත යෝජනාව අනුව දෙවැනි පාර්ශ්වය විසින් ගෙන එනු ලැබූ ප්‍රතියෝජනාව අනුව මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු වෙත සම්පූර්ණ සහ අවසාන සමතයක් වශයෙන් සානුකම්පිත දීමනාවක් සේ සලකා රුපියල් තිස්පන්දහස (රු. 35,000) ක මුදලක් ගෙවීමට නියම කරමි.

මෙය යුක්ති සහගත සහ සාධාරණ ප්‍රදානයක් බව තීරණය කරමි.

ඉහත සමත නියෝගයට අනුව මෙම මුදලට අදාළ චෙක්පත 2021.03.29 දින මෙම බේරුම්කරණ සභාවේ දී ගෙවා අවසන් කිරීමට දෙවැනි පාර්ශ්වය සිය කැමැත්ත ප්‍රකාශ කර බැවින් හා පළමු පාර්ශ්වය එම මුදල එදිනට ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් අනතුරුව 2021.03.29 වන දින මා ඉදිරියේ දී අදාළ මුදල වෙනුවෙන් මහජන බැංකුවේ යුනියන් පෙදෙස ශාඛාවේ චෙක්පත්

අංක 107688 හා 2021.03.18 දිනැති රුපියල් තිස්පන්දහස (රු. 35,000) ක් වටිනා චෙක්පත පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු වෙත ලබා දීමෙන් අවසන් කරන ලදී. ඒ අනුව මෙම ආරවුල සමත වූ ආරවුලක් බවට තීරණය කරමි.

මෙය යුක්ති සහගත හා සාධාරණ ප්‍රදානයකි.

**ඕ. ලීලාරත්න,**
බේරුම්කරු,
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්.

2021 අප්‍රේල් මස 01 වැනි දින.

11-601

---

*මගේ අංකය :* IR/15/24/2012.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.03.07 දිනැති හා අංක 2113/55 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2019.02.28 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, බ්‍රාහ්මණගම, අංක 183/ඒ/2 හි පදිංචි පී. ටී. රංජිත් මයා ඇතුළු සේවක පිරිස සහ නුගේගොඩ, හයිලෙවල් පාර, අංක 170 හි පිහිටි ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2021.04.01 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 ඔක්තෝබර් මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික බේරුම්කරණයේ දී ය.

බේරුම්කරු ඕබඩගේ ලීලාරත්න මැතිතුමා ඉදිරිපිට දීය.

පී. ටී. රංජිත් මයා ඇතුළු සේවක පිරිස,
නො. 183/ඒ/2,
බ්‍රාහ්මණගම,
පන්නිපිටිය.

*පළමු පාර්ශ්වය*

ආරවුල් අංකය - IR/15/24/2012.
බේරුම්කරණ නඩු අංකය : A/15/2019

සහ

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය,
නො. 170, හයිලෙවල් පාර,
නුගේගොඩ.

*දෙවැනි පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරවුල
පෙනී සිටීම-
පළමු පාර්ශ්වය වෙනුවෙන්-
නියෝජිත ග්‍රේෂන් සිල්වා මහතා සමග
එම්. කේ. හේමපාල මහතා
දෙවැනි පාර්ශ්වය වෙනුවෙන්-
පරිපාලන නිලධාරිණී එච්. ආර්. කේ. හේරත් මිය,
නීතිඥ උපුල් ප්‍රනාන්දු මහතා

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා 1957 අංක 14 හා 1952 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකරන ලදී.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සේවය කරන/සේවය කළ පහත නම් සඳහන් නිලධාරීන්ට එම ආයතනය විසින් 2006 කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මක කිරීමේදී ඔවුන් දැරූ කණිෂ්ඨ විධායක ශ්‍රේණිවලින් කළමණාකරණ සහකාර කාණ්ඩයේ තබා වැටුප් සැකසීමේ දී ඔවුන්ට අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේනම් ඔවුන් එකිනෙකා වෙත වෙන වෙනම හිමිවිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳ වේ."

1. පී. ටී. රංජිත් මයා (දැනට විශ්‍රාම ලබා ඇත.)
2. ඩබ්. පී. ජී. වික්‍රමරත්න මයා
3. ජී. එස්. ජේ. පෙරේරා මයා
4. පී. වී. මාලනී මිය
5. ඕ. එස්. ආරියසිරි මයා
6. ඩබ්. ඒ. පී. පී. වික්‍රමසිංහ මයා
7. වී. පී. ශාන්ති මිය

දෙපාර්ශ්වය විසින්ම සිය පළමු හා දෙවැනි ප්‍රකාශ ගොනු කරන ලද අතර, එම ප්‍රකාශ මගින් තම ස්ථාවරයන් දන්වා සිටින ලදී. මෙහි දී ඉහත ඉල්ලුම්කරුවන් අතරින් පී. ටී. රංජිත් මහතා ජී. එස්. ජේ. පෙරේරා මහත්මිය සහ පී. ඩී. මාලනී මහත්මිය දැනට විශ්‍රාම ලබා ඇති අතර, ඩබ්. පී. ජී. වික්‍රමරත්න මහතා සේවයෙන් ඉල්ලා අස්වී ඇත. ඉතිරි තිදෙනා වන ඕ. එස්. ආරියසිරි මහතා,

ඩබ්. ඒ. පී. පී. වික්‍රමසිංහ මහතා සහ වී. පී. ශාන්ති මහත්මිය දැනට සේවයේ යෙදී සිටී. මේ අතරින් අංක 2 හා අංක 5 යටතේ සිටින දෙදෙනා පරිපාලන නිලධාරීන් ලෙස උසස් කර JM 1-2 වැටුප් කාණ්ඩයේ පිහිටුවා ඇති බව දෙවැනි පාර්ශවය විසින් දැනුම් දී ඇත. ඊට අමතරව අංක 6 යටතේ නම සඳහන් වික්‍රමසිංහ මහතාද JM 1-2 වැටුප් කාණ්ඩයේ පිහිටුවා ඇති බවද දෙවැනි පාර්ශවය විසින් කරුණු දක්වා ඇත. තවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අංක DMS/1637 දරන 2017.11.23 දරන ලිපියේ (ආයතනය විසින් ඉදිරිපත්කර ඇති ලිඛිත දේශනවල ඇමුණුම 04) 04 වන ඡේදය මගින් දක්වා ඇත්තේ බඳවා ගැනීමේ පටිපාටිය සකස්කර අනුමත කරවා ගත යුතු බවත්, දැනට ස්ථිර සේවයේ නියුතු සේවකයින් අන්තර්ග්‍රහනය කිරීමෙන් පසු ඇති වන පුරප්පාඩු පිරවිය යුතු බවත් වේ.

තවද, එකී ලිපියේ ඇමුණුම 05 (ගොනුවේ පිටු අංක 41) මගින් JM 1-2 කාණ්ඩය  යටතේ වර්ග කර තිබූ අභ්‍යන්තර විගණක හා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්/නීති නිලධාරි යන තනතුරු දෙක MM 1-1 කාණ්ඩයට ඇතුළත් කර සංශෝධනය කර ඇති බවයි.

මෙම ආරවුල පැන නැග ඇත්තේ කළමණාකරන චක්‍රලේඛ 30/2006 ක්‍රියාත්මක කිරීමේදී බව ඉතා පැහැදිලි කරුණක්වේ. එම චක්‍රලේඛය මගින් මෙම ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය ආවරණය කර නොතිබූ අතර පසුව එම ආයතනයටද මෙම චක්‍රලේඛය අදළ කර ඇත.

පැමිණිල්ලේ සාක්ෂි ලබාදීමේදී හා දෙවැනි පාර්ශවයේ සාක්ෂි ලබාදීමේදී පිළිගත් පොදු කරුණක් වනුයේ කළමණාකරන චක්‍රලේඛ 30/2006 ක්‍රියාත්මක කරන අවස්ථාව වන විටත් මෙම ඉල්ලුම්කරුවන් සියළු දෙනම ආයතනයේ විධායක ගණයට වැටෙන V ශ්‍රේණියේ තනතුරුවල රාජකාරි කර ඇති බවයි. මෙම තත්ත්වය දෙවැනි පාර්ශවය විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමුකර ඇති පිටු අංක 458 හි 2013.07.19 දතමින් යුක්තව ඇති R 6 ලේඛනයෙහි පළමු ඡේදයෙන් ද, පිටු අංක 440 හි 2014.02.28 දිනැති R 7 දරන ලේඛනයේ 3 වැනි ඡේදයෙන් ද, R 10 ලේඛනයේ 2 වැනි ඡේදයෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ ලිපිය ආදී ලිපි ගණනාවකින් මෙන්ම පළමු පාර්ශවය විසින් ලකුණු කරන ලද R23 (ඔප්පුකිරීමේ භාරයට යටත්කර ඇතත් ඔප්පුකර නැත) ලේඛනයෙහිද 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා නිලධාරින් විධායක ගණයට අයත් බවට සඳහන් කර ඇති බැවින් එකී A 23 ලේඛනය ඔප්පුකිරීමේ භාරයට යටත්ව සලකුණු කරද දෙවැනි පාර්ශවය විසින්ම මෙම ඉල්ලුම්කරුවන් සියළු දෙනාම V ශ්‍රේණියේ විධායක නිලධාරීන් ලෙස සේවය කල බවට තහවුරු කිරීම හේතුවෙන් අදල ලේඛනයේ සඳහන් ශ්‍රේණික්‍රමය නිවැරදි බව තහවුරු වී ඇත. ඒ අනුව එම ලේඛණය ඔප්පු කිරීම දෙවැනි පාර්ශවය විසින්ම සිදුකර ඇති බවද නිරීක්ෂණය විය. තවද, ආයතනය විසින් අංක NTMI/23/E බ. ල. පරිපාටි හා 2013.08.15 දිනැති ලිපියට පිළිතුරු ලෙසට ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මගින් සභාපති ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය වෙත යොමුකරන ලද ගොනුවේ පිටු අංක 444 හි ඇති ආර් 8(b) ලේඛනයේ 3 වන ඡේදයෙහි මෙසේ සඳහන් කර ඇත. මෙම නිලධාරින්ගේ සුදුසුකම් මත නව සේවා කාණ්ඩවල අදල තනතුරුවලට පත්කිරීමට සලකා බැලීම සඳහා ආයතනය කටයුතු කරන්නේ නම් මෙම කොමිෂන් සභාවේ විරුද්ධත්වයක් නොමැත. නමුත් මේ සඳහා ඔබ ආයතනයේ බඳවා ගැනීමේ හා උසස්වීමේ පරිපාටි සම්පූර්ණ කළ යුතුය. මෙය මෙතෙක් සම්පූර්ණ කර නැත.'' තවද එම ලිපියෙහිම 05 වන ඡේදයෙන් ද නැවත වරක් තහවුරු කර ඇත්තේ මෙම නිලධාරීන්ගේ සේවාකාලය අනුව ශ්‍රේණිගත උසස්වීම් ලබාදිය හැකි බව වන අතර එසේ කිරීම සඳහා බඳවා ගැනීමේ හා උසස්වීමේ පරිපාටිය සම්පූර්ණ කළ යුතු බවටයි. කෙසේ වුවද ආයතනය විසින් දිගු කාලයක් තිස්සේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සම්පූර්ණ කර නොතිබුන අතර එය 2018 දී සකස්කර තිබුණද ඒ මගින් මෙම ඉල්ලුම්කරුවන් වෙනුවෙන් සහනයක් ලබාදීමට ඉඩකඩ ලබාදී නොතිබුනි.

මේ අනුව පෙනී යන්නේ ආයතනය දිගින් දිගටම මෙම සේවකයින්හට JM 1-2 වැටුප් කාණ්ඩය ලැබිය යුතු බවට කරුණු ඉදිරිපත් කරත් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් දෙනු ලැබූ උපදෙස් අනුව කටයුතු නොකිරීම හේතුකොට ගෙන මෙම ඉල්ලුම්කරුවන්ට මෙම JM වැටුප් කාණ්ඩය අහිමි වී ඇති බවයි. එය කිසිසේත්ම ඉල්ලුම්කරුවන්ගේ දෝෂයක් හෝ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ හෝ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ දෝෂයක් නොවන බව ඉතා පැහැදිලි වේ. එම ආයතන වලින් මෙම නිලධාරීන්ට ඉහල වැටුප් තල ලබාදීමට අනුගමනය කල යුතු කාර්යය ඉතා පැහැදිලිව සඳහන්කර තිබිය දීත් ආයතනය ඒ අනුව කටයුතු නොකරමින් දිගින් දිගටම එම සේවකයන්ට අසාධාරණයක් සිදුව ඇතිබව පමණක් විවිධ ආයතනවලට දන්වමින් සිට ඇති බවද නිරීක්ෂණය කලෙමි. කෙසේවුවද, 2018.10.10 දිනැතිව ''ක්‍රියාත්මක කිරීමේ/උපදේශන සේවා'' සේවා ගණය සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර ඇති අතර එහිදීද ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් දෙන ලද උපදෙස් අනුව මෙම ඉල්ලුම්කාර සේවකයන්ගේ ගැටළුව කෙරෙහි නිසි අවධානය යොමුකර නොමැති බවද නිරීක්ෂණය කළෙමි. මෙම ඉල්ලුම්කාර සේවකයන් සම්බන්ධයෙන් සකස්කල යුතුව තිබුනේ JM 1-2 වැටුප් කාණ්ඩයට සේවකයින් බඳවා ගැනීමේදී මෙම සේවකයන් ඊට ඇතුළත්කර ගත හැකි ආකාරයෙන් බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර ගැනීම බවද නිරීක්ෂණය කළෙමි.

මෙම ආරවුලට තුඩුදුන් හේතුව සම්බන්ධයෙන් දෙපාර්ශවයම එකම ස්ථාවරයක සිට කරුණු දැක්වීම තුළින් මෙම ඉල්ලුම්කරුවන් හට අසාධාරණයක් සිදුවී ඇති බවට දෙපාර්ශවයම එකම ස්ථාවරයක සිටිමින් මෙම ඉල්ලුම්කරුවන් නියමිත වැටුප්තලයෙහි පිහිටවිය යුතු බවට එකගවී ඇත. මෙම ප්‍රධානය ලබාදීමේදී එම තත්වයද සැලකිල්ලට ගතිමි. තවද, මෙම බේරුම්කරණය පවත්වාගෙන යන අතරතුර දෙවැනි පාර්ශවය වන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සභාපති වරිය විසින් මෙම ඉල්ලුම්කාර සේවකයින් සියළු දෙනාටම අසාධාරණයක් සිදුව ඇති බැවින් එය නිවැරදි කිරීම සඳහා ඔවුන් JM 1-2 වැටුප් කාණ්ඩයේ සුදුසු පියවරක තැබීමට තමා විරුද්ධ නොවන බවත්, එම වැටුප් තලයෙහි ආරම්භක පියවරෙහි තැබුවහොත් කිහිප දෙනෙකුට අසාධාරණයක් සිදුවන බවත්, එනම් වැටුප් අඩුවීමක් සිදුවන බවත්, එබැවින් ඔවුන් දැනට ලබන වැටුපට අනුරූපීවන සුදුසු වැටුප් පියවරක තැබීම සම්බන්ධයෙන් තමන් විරුද්ධ නොවන බවත් මා වෙත දන්වා ඇති අතර, ඒ අනුව එකී ඉල්ලුම්කරුවන්ට ගැලපෙන පරිදි ඔවුනට අසාධාරණයක් නොවන ආකාරයෙන් සුදුසු වැටුප් පියවරෙහි තැබීමත් එසේ වැටුප් අඩුවීමක් නොවන ඉල්ලුම්කරුවන් ආරම්භක වැටුප් පියවරෙහි තැබීමත් යෝග්‍ය බවද දන්වා ඇත. තවද, මෙම ඉල්ලුම්කාර සේවකයන් 30/2006 චක්‍රලේඛය ක්‍රියාත්මක කරන විටත් විධානය ශ්‍රේණියේ තනතුරු දරමින් සිටි බැවින් ඔවුන් JM

1-2 කණිෂ්ඨ විධායක තනතුරෙහි පිහිටුවන ලෙසට ඉල්ලීමක් කර ඇත.

එහෙත් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 2020.10.28 දාතමින් පිළිතුරු ලිපියක් (ගොනුවේ පිටු අංක 403 සහ 404) ආයතනය විසින් කළමණාකරණ චක්‍රලේඛ නිකුත් කිරීමට පෙර සේවකයන් වර්ගකර ඇති ආකාරය එනම් එම ආයතනික කාර්ය පරිපාටිය ජාතික මට්ටමට ගැලපෙන ආකාරයට සකස්කරනු ලැබූවක් හෝ ඒ පිළිබඳ බලධාරිත්වය සහිත ආයතනයකින් සහතික කරනු ලැබූ එකක් නොවන බව නිරීක්ෂණය වන බව දන්වා ඇත. මේ තත්ත්වය පිළිබඳව සලකා බැලීමේදී එකී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ මත සකස් කරන ලද ආයතනික කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් සේවකයන්ට කිසිදු වගකීමක් පැවරිය නොහැකි අතර, එය ඔවුන්ගේ පාලනයෙන් තොර කටයුත්තක් බව ඉතා පැහැදිලිවේ. එසේ ආයතනයේ බලධාරින් විසින් සකස්කරන ලද ආයතනික කාර්ය පරිපාටියට අනුව දීර්ඝ කාලයක් තිස්සේ එකී වරප්‍රසාද මෙම සේවකයන් භුක්ති විද ඇති බවත්, එසේ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් කරන ලද නිරීක්ෂණ කරන ලද කරුණු මත එම සේවකයන්ගෙන් එකී වරප්‍රසාද උදුරා ගැනීම කිසිසේත්ම සාධාරණ හා යුක්ති සහගත කරුණක් නොවන බවද මාගේ හැගීමයි. අනික් අතට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව පවසන ආකාරයට ආයතනය මෙතෙක් අනුගමනය කරන ලද ආයතනික කාර්ය පරිපාටියට කිසිදු අනුමැතියක් නොමැතිබව පවසන්නේ නම් එතෙක් එම ආයතනයේ සේවකයන් වර්ගීකරණය කර ඇති ආකාරය හා උසස්වීම් ලබාදී ඇති ආකාරයද ගැටළු සහගත තත්ත්වයකට පත්වන අතර එම තත්ත්වයද නැවත සමාලෝචනය කිරීමට සිදුවනු ඇත. අනෙක් අතට මෙම ආයතන පිහිටුවා ඇත්තේ පාර්ලිමේන්තු පනතකින් වන අතර එම පනත මගින් අදාළ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට සිය කටයුතු පවත්වාගෙන යාම සඳහා පූර්ණ බලතල ලබාදී ඇති බැවින් ආයතනය සම්බන්ධයෙන් එතෙක් ගන්නා ලද තීරණ හා ක්‍රියාත්මක කරන ලද තීරණ සම්බන්ධයෙන් වගකීම ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයට විනා එහි සේවකයන්ට නොවන බවද නිරීක්ෂණය කලෙමි. අනික් වැදගත් කරුණ වනුයේ මෙම සේවකයන් සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේපකරනු ලබන කළමණාකාර සේවා දෙපාර්තමේන්තුව විසින්ම මෙම බේරුම්කරණ ගොනුවෙහි අංක 6 යටතේ නම සදහන් ඩබ්. ඒ. පී. පී. වික්‍රමසිංහ මහතා වෙත ඔහුට පෞද්ගලික වනසේ 2018.05.22 ලිපිය මගින් JM 1-2 වැටුප් කාණ්ඩය ලබාදී තිබීමයි.

තවද, පළමු පාර්ශවය හා දෙවැනි පාර්ශවය එකගවූ ආකාරයට සකස් කරන ලද හා විගණන අංශය විසින් විගණනය කරන ලද මෙම පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන් JM 1-2 වැටුප් කාණ්ඩයේ පිහිටුවා සුදුසු වැටුප් පියවරෙහි තබා සකස්කරන ලද වගුවක් මා වෙත ඉදිරිපත්කර ඇති අතර, එම වගුවට අදාළ ආවරණ ලිපිය ගොනුවේ 349 පිටුවේද, අදාළ හිග ගණනය කරන ලද ලේඛන පිටු අංක 350 සිට 384 දක්වා පිටුවලද සටහන්කොට මෙම බේරුමකරණයට යොමුකර ඇත. තවද දෙපාර්ශවය විසින් එකගව අදාළ වැටුප් පියවරයන් සදහන් කරමින් සකස්කරන ලද දෙපාර්ශවය විසින් අත්සන් තබමින් යොමුකරන ලද ලේඛනයක්ද මා වෙත ඉදිරිපත්කර ඇත. ඒ අනුව දෙවැනි පාර්ශවය විසින් පළමු පාර්ශවයට අසාධාරණයක් වී ඇති බවත්, ඔවුන්ගේ ඉල්ලීම් සාධාරණ බවත් දෙවනි පාර්ශවය විසින් දිගින් දිගටම සනාථ කර ඇත. කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවට මේ සම්බන්ධයෙන් විවිධ අවස්ථාවලදී දිගුකලක සිට ලිපි හා නිර්දේශයන් ඉදිරිපත්කර ඇතත් කිසිදු අවස්ථාවක කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් මේ සම්බන්ධයෙන් ධනාත්මක පිළිතුරක් ලබාදී නොමැති බවද නිරීක්ෂණය කලෙමි.

### ප්‍රදානය

එම සියලුම කරුණු සලකා බැලීමේදී මෙම ඉල්ලුම්කාර පළමු පාර්ශවයේ සේවකයන්හට අසාධාරණයක් සිදුවී ඇති බව සාධාරණ මිනිසාගේ දෘෂ්ඨිකෝණයෙන් බැලීමේදී මනාව පැහැදිලි වනු ඇත. ඒ අනුව මෙම සේවකයන්ට කළමණාකාර සේවා දෙපාර්තමෙන්තුවේ අංක 30/2006 චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේදී අසාධාරණයක් සිදුව ඇති බව තීරණය කරමි. එබැවින් මෙම සේවකයන් වෙනුවෙන් පහත සහනයන් ප්‍රදානය කරන අතර, එම තනතුරු ඔවුනට පුද්ගලික වනසේ ලබාදීමටත්, එම තනතුරු ඔවුන් මියයාමෙන්, සේවයෙන් ඉවත්වීමෙන් හෝ විශ්‍රාම යාමෙන් අහෝසිවන ආකාරයටත් ලබාදෙන ලෙසට නියම කරමි. ගොනුවේ R 23 (පිටු අංක 350 සිට 384 දක්වා වගුවල ඇති පරිදි JM 1-2 කාණ්ඩයේ නියමිත වැටුප් පියවරයන්හි තැබීමටත්, ඒ අනුව සකස්කරන ලද හිග වැටුප් මෙම ඉල්ලුම්කරුවන්ට ගෙවන ලෙසටත් මෙයින් නියම කරමි. තවද, අදාළ ලේඛණවල ඇති ඒ ඒ වර්ෂයට හා වැටුප් වර්ධක දිනයට අදාළවනසේ වැටුප් පියවරෙහි තබා වැටුප් සකස්කරන ලෙසටද ඒ අනුව හිග වැටුප් ගෙවන ලෙසටද මෙයින් නියම කරමි. හිග වැටුප් ගෙවීමේදී සේවක අර්ථසාධක අරමුදල සඳහා වන සේවකයන්ගේ දයකත්වය වන 10%ක මුදල අඩුකර ඉතිරි මුදල ඒ ඒ සේවයකයන් වෙත ගෙවන ලෙසට මෙයින් නියම කරමි.

1. වී. පී. ශාන්ති මිය වෙත R 23 ලේඛනයෙහි වගු අංක 01 හි සඳහන් ආකාරයට JM 1-2 වැටුප් කාණ්ඩයෙහි නියමිත පියවරෙහි තබා ඒ අනුව වැටුප් සකස්කර ඒ අනුව 2006 ජනවාරි මස සිට 2020 මැයි මස දක්වා වන හිග වැටුප ලෙසට රුපියල් හයලක්ෂ පන්දහස් නවසිය විසිහතයි ශත විස්ස ((රු.605927.20) (67,3252.45 - 67,325.25)) ක මුදලක් ගෙවන ලෙසටද,

2. ඕ. එස්. ආරියසිරි මහතා R 23 ලේඛනයේ වගු අංක 02 හි සඳහන් ආකාරයට JM 1-2 වැටුප් කාණ්ඩයෙහි නියමිත පියවරෙහි තබා ඒ අනුව වැටුප් සකස්කර 2006 ජනවාරි මස සිට 2020 මැයි මස දක්වා හිග වැටුප ලෙසට රුපියල් හයලක්ෂ හැටතුන්දහස් හත්සිය හැත්තෑඑක ((රු. 663771.00 (737523.33-73752.33)) ක මුදලක් ගෙවන ලෙසට ද,

3. ඩබ්. ඒ. පී. පී. වික්‍රමසිංහ මහතාට (මොහු 2018.05.22 දිනැති ලිපිය මගින් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් JM 1-2 වැටුප් තලයේ එදින සිට පිහිටුවා ඇත.) R23 ලේඛනයේ වගු අංක 03 හි සඳහන් ආකාරයට JM 1-2 1-2 වැටුප් කාණ්ඩයෙහි නියමිත පියවරෙහි තබා ඒ අනුව වැටුප් සකස් කිරීමටද, ඒ අනුව 2006 ජනවාරි මස සිට 2020 මැයි මස දක්වා වන හිග වැටුප ලෙසට රුපියල් පන්ලක්ෂ දොළොස් දහස් එකසිය අනූවයි ශත පනස් හත ((රු.512190.57 (569100.63-59610.06)) ක මුදලක් ගෙවන ලෙසටද,

4. ජී. ඒ. ජේ. පෙරේරා මහතා R 23 ලේඛණයේ වගු අංක 04 හි සදහන් ආකාරයට JM 1-2 වැටුප් කාණ්ඩයෙහි නියමිත පියවරෙහි තබා ඒ අනුව වැටුප් සකස් කර 2006 ජනවාරි

මස සිට 2015 පෙබරවාරි මස දක්වා වන හිග වැටුප ලෙසට රුපියල් දෙලක්ෂ අනූහත්දහස් අටසිය පහළවයි ශත අසූපහ ((රු. 297815.85 (330906.50 - 33090.65)) ක මුදලක් ගෙවන ලෙසටද,

5. ඩබ්. පී. ජී. වික්‍රමරත්න මහතා R 23 ලේඛනයේ වගු අංක 5හි සඳහන් ආකාරයට JM 1-2 වැටුප් කාණ්ඩයෙහි නියමිත පියවරෙහි තබා ඒ අනුව වැටුප් සකස්කර 2006 ජනවාරි සිට ඔහු සේවයෙන් ඉල්ලා අස්වූ 2013 සැප්තැම්බර් මස 02 දක්වා කාලයට හිග වැටුප ලෙසට රුපියල් දෙලක්ෂ හැටදහස් නවසිය අටයි ශත තිස් නවය ((රු.260908.39 (289898.21-28989.82)) ක මුදලක් ගෙවන ලෙසටද,

6. පී. වී. මාලිනී මිය R 23 ලේඛනයේ වගු අංක 6 හි සඳහන් ආකාරයට JM 1-2 වැටුප් කාණ්ඩයෙහි නියමිත පියවරෙහි තබා ඒ අනුව වැටුප් සකස්කර 2006 ජනවාරි සිට ඇය සේවයෙන් විශ්‍රාම ගිය 2017 පෙබරවාරි මස 18 දක්වා වූ කාලයට හිග වැටුප ලෙසට රුපියල් තුන්ලක්ෂ අසූනවදහස් දහසයයි ශත දහඅට ((රු. 389016.18 (432240.20-43224.02)) ක මුදලක් ගෙවන ලෙසටද,

7. පී. ටී. රංජිත් මහතා R 23 ලේඛනයේ වගු අංක 7හි සඳහන් ආකාරයට JM 1-2 වැටුප් කාණ්ඩයෙහි නියමිත පියවරෙහි තබා ඒ අනුව වැටුප් සකස් කර 2006 ජනවාරි මස සිට ඔහු විශ්‍රාම ලැබූ 2016 ජනවාරි මස 05 දින දක්වා වූ කාලයට හිග වැටුප ලෙසට රුපියල් තුන් ලක්ෂ හතලිස් හත්දහස් හාරසිය පහළවයි ශත එක ((රු.347415.01 (386016.68 - 38601.67) ක මුදලක් ගෙවන ලෙසට ද,

ඉහත ඉල්ලුම්කරුවන් 7 දෙනා වෙනුවෙන් ගණනය කරන ලද සම්පූර්ණ හිග වැටුප් මුදල ලෙස රුපියල් තිස්ලක්ෂ හැත්තෑහත්දහස් හතලිස් හතරයි ශත විස්ස (රු. 3,077,044.20) ක මුදලක් මෙම ප්‍රදනය ගැසට් පත්‍රයේ පලකරන ලද දින සිට මාස 2ක් ඇතුළත ඒ ඒ සේවකයන්ට පුද්ගලිකව ලබාගත හැකි වන සේ සහකාර කම්කරු කොමසාරිස් බටහිර කොළඹ වෙත තැන්පත් කරන ලෙසටද,

ඉහත නියමය පරිදි ගෙවනු ලබන හිග වැටුප්වලට අදාළ සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තීන්ගේ භාරකාර අරමුදල මෙම ප්‍රදනය ගැසට් පත්‍රයේ පළකරන ලද දින සිට මාස දෙකක් ඇතුලත නියමිත ආයතනවලට ගෙවා අවසන් කරන ලෙසටත් මෙයින් නියම කරමි.

තවද, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තීන්ගේ භාර අරමුදල් නිසි පරිදි ගෙවීමෙන් අනතුරුව අදාළ ගෙවීම් රිසිට්පත්වල සහතික පිටපතක් ඒ ඒ ඉල්ලුම්කරුවන්ට තම මුදල් නිසි පරිදි අදාළ ආයතනවල තැන්පත් කල බවට දැනගතහැකිවන පරිදි ඔවුනට පුද්ගලිකව භාර දෙන ලෙසටද මෙයින් නියම කරමි.

මෙම ප්‍රදනයේ නියමයන් සම්පූර්ණ කර ඒ බව බටහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් තැන වෙත වාර්තා කරන ලෙසට මෙයින් නියම කරමි.

මෙම යුක්ති සහගත සහ සාධාරණ ප්‍රදනයක් බවට තීරණය කරමි.

**ඕ. ලීලාරත්න,**
බේරුම්කරු,
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්.

11-602

---

*මගේ අංකය* : IR/07/15/2013(A)

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.03.20 දිනැති හා අංක 2063/21 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.03.16 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 03, ඇලෝයි මාවත, අංක 06හි පිහිටි ලංකා වතු සේවා සංගමය (සේවකයින් 04 දෙනෙකු වෙනුවෙන්) සහ හලාවත, පුත්තලම් පාර, අංක 165 හි පිහිටි හලාවත වැවිලි සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2021.03.15 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 ඔක්තෝබර් මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික බේරුම්කරණයේ දී ය.

බේරුම්කාර ඕබඩගේ ලීලාරත්න මැතිතුමා ඉදිරිපිට දීය.

ලංකා වතුසේවා සංගමය,
අංක 6, ඇලෝයි මාවත,
කොළඹ 03
(සේවකයන් 04 දෙනෙකු වෙනුවෙන්)

IR/07/15/2013 (A)

*පළමු පාර්ශ්වය*

බේරුම්කරණ නඩු අංකය : A 19/2018

සහ

හලාවත වැවිලි සමාගම,
අංක 165, පුත්තලම් පාර,
හලාවත,

*දෙවැනි පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල
පෙනී සිටීම-
පළමු පාර්ශ්වය වෙනුවෙන්-

ලංකා වතුසේවා සංගමයේ රැකවරණ නිලධාරි පළාත් සංවිධායක ආර්. එම්. පී. සෝමරත්න මහතා සහ ලංකා වතුසේවා සංගමයේ රත්නපුර පළාත් කාර්යාලයේ සහකාර ලේකම් (කාර්මික සබඳතා) ඒ. ඒ. රංජිත් හේමචන්ද්‍ර මහතා

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන්-

ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය වෙනුවෙන් නීතිඥ ධනංජය ජයකොඩි මහතා සහ නීතිඥ රුවින්ද වැලිකල මහතා සමග හලාවත වැවිලි සමාගම නියෝජනය කරමින් එකී සමාගමේ මානව සම්පත් සංවර්ධන හා පරිපාලන නිලධාරිනි අසංකා රණසිංහ හා මානව සම්පත් හා පරිපාලන කළමණාකරු තිස්ස අත්තනායක මහතා පෙනී සිටින ලදී.

ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලානත්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කර මා වෙත යොමුකර ඇත. ඉහත පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

''හලාවත වැවිලි සමාගමේ සේවයේ යෙදී සිටින බී. එම්. කනුෂ්කා තරින්දි, එච්. ජී. ඒ. අයි. ප්‍රසාදි, ඩබ්. එස්. එන්. සුරංගිකා, ඩබ්. ජේ. ආර්. ප්‍රනාන්දු යන සේවක සේවිකාවන්ට ඔවුන්ගේ සේවා ගිවිසුමේ කොන්දේසිවලට අනුව වසරක පුහුණු කාලයකින් පසුව අදාළ ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය නොකිරීම යුක්ති සහගතද? එසේ නොවේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ.''

මෙම ආරවුල සම්බන්ධයෙන් දෙපාර්ශය විසින් තම පළමු හා දෙවැනි ප්‍රකාශ ගොනු කිරීමෙන් අනතුරුව මෙම බේරුම්කරණ නඩුව ප්‍රථම වතාවට 2018.08.14 හා ඉන් අනතුරුව 2018.08.23 යන දින වලදී කැඳවූවද පළමු පාර්ශවය සහභාගී නොවීම හේතුවෙන් අවසාන වශයෙන් 2018.09.03 කැඳවීමෙන් අනතුරුව දෙපාර්ශවයම විභාගය සඳහා සහභාගී වී තිබූ අතර, දෙපාර්ශවය අතර සමථයක් තිබේ නම් ඒ බව ඊළග දිනයේදී බේරුම්කරණය වෙත දනුම් දෙන ලෙස දන්වා සිටින ලදී.

ඉන් අනතුරුව 2018.09.12 දින මෙම ආරාවුල සම්බන්ධයෙන් කැඳවූ අවස්ථාවේදී සමථයක් නොමැති බවට දෙවැනි පාර්ශවය දනුම් දීමෙන් අනතුරුව නඩු විභාගය ආරම්භ කරන ලදී. ඒ අනුව දෙවැනි පාර්ශවය වන හලාවත වැවිලි සමාගම විසින් සිය නඩුව ආරම්භ කරන ලද අතර එහිදී හලාවත වැවිලි සමාගම වෙනුවෙන් එම ආයතනයේ මානව සම්පත් හා පරිපාලන කළමණාකරු වන තිස්ස අත්තනායක මහතා සාක්ෂි ලබාදෙන ලදී. දීර්ඝ කාලයක් තිස්සේ සිය සාක්ෂිය ලබාදෙමින් හරස් ප්‍රශ්න වලට භාජනය වෙමින් තම සාක්ෂිය 2019.11.14 දින අවසන් කරන ලද අතර, දෙවැනි පාර්ශවය සිය නඩුව අවසන් කරන ලදී.

ඉන් අනතුරුව පළමුවන පාර්ශවය විසින් සිය නඩුව ආරම්භ කරමින් ප්‍රථමයෙන්ම බාලසූරිය මුදියන්සේලාගේ කනුෂ්කා තරින්දි, නිම්මි සුරංගිකා යන අය දීර්ඝ වශයෙන් සිය සාක්ෂි ලබාදුන් අතර, රටේ පැවැති කොවිඩ් 19 වසංගතය හමුවේ දිගුකාලයක් මෙම නඩුව අත්හිටුවීමට සිදුවූ බවද මෙහිදී සටහන් කිරීම ඉතා වැදගත් වේ. මෙම නඩුව වෙනුවෙන් දිගුකාලයක් ගතවීමට හේතුවූ කරුණු අතර, දීර්ඝ සාක්ෂි ලබාදීමත්, හරස් ප්‍රශ්න දීර්ඝ ලෙස ඇසීමත් මෙන්ම පැවති කොවිඩ් 19 වසංගතය හමුවේ දිගුකාලයක් මෙම පරීක්ෂණය අත්හිටුවීමට සිදුවීමත් යන කරුණු බලපෑ බව මෙහිලා සඳහන් කරමි.

කෙසේ වුවද නැවත වරක් සමතයක් සිදුකිරීමට හැකියාව ඇද්ද යන්න දෙපාර්ශවයෙන් විමසමින් විශේෂයෙන්ම මෙහි දෙවැනි පාර්ශවය වන හලාවත වැවිලි සමාගම වෙත මා විසින් මෙම ආරාවුල සමතයකට පත්වීම වඩාත් සුදුසු හා කාලෝචිත ක්‍රියාවක් බවත් මාගේ දනුම් දීම හලාවත වැවැලි සමාගමේ නව සභාපතිවරයා වෙත දනුම් දෙන ලෙසටත් කරන ලද දනුම්දීමට අනුව මෙම නඩුව සමතයකට පත්විය හැකි බවට හා අදාළ ගිණුම් පිළිබඳව ඉදිරියේදී දනුම් දෙන බවට දෙවැනි පාර්ශවය මා වෙත දනුම් දෙන ලදී. ඉන් අනතුරුව නැවතත් දිවයින පුරා කොවිඩ් 19 වසංගතයේ දෙවැනි රැල්ල මතුවීම කරනකොට ගෙන මාස කිහිපයක්ම මෙම පරීක්ෂණය පැවැත්වීම ප්‍රමාද විය. කෙසේ වුවද 2021.02.01 දින මෙම ආරාවුල සම්බන්ධයෙන් පරීක්ෂණය නැවතත් කැඳවූ අවස්ථාවේදී දෙපාර්ශවය විසින් සමත යෝජනාව අවසන් වශයෙන් මෙම බේරුම්කරණය ඉදිරියේදී ස්ථිර කරන ලද අතර, එම සමතය පහත පරිදි විය :

01. ඉහත නම් සඳහන් සේවකයින් හට තම පත්වීම ලිපියට අනුව වසරක් සම්පූර්ණ වීමෙන් අනතුරුව සිය පත්වීම් ස්ථිර කිරීමටත් එදින සිට 2020.11.20 දින දක්වා හිඟ වැටුප් හා සියලුම දීමනා ගණනය කොට ගෙවීමටත්,

02. එසේම අදාළ පත්වීම් ලිපියට අනුව වසරක පුහුණුව අවසානවීමෙන් අනතුරුව ස්ථිර පත්වීම ප්‍රදනය කිරීමටත්,

03. හිඟ වැටුප් සම්බන්ධයෙන් අදාළ සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තීන්ගේ භාර අරමුදල් අදාළ ආයතන වෙත ගෙවීමටත්, හා

04. ඉහතකී ආකාරයෙන් සමතය පූර්ණ සහ අවසන් සමතයක් ලෙසට පිළිගෙන ආරවුල අවසන් කිරීමටත් දෙපාර්ශවය එකගවිය.

ඒ අනුව මෙම සමතය සම්බන්ධයෙන් මාගේ ප්‍රදනය පහත පරිදි සටහන් කරමි.

ප්‍රදනය

මෙම ආරවුලට පාදකවූ සේවකයන් බඳවා ගැනීමේදී ලබාදුන් පත්වීම් ලිපියේ කොන්දේසි ප්‍රකාරව වසරක පුහුණු කාලය අවසන් වීමෙන් අනතුරුව පහත පරිදි සේවක සේවිකාවන්හට ස්ථිර තනතුරු ප්‍රදානය කරන ලෙසට නියම කරමි.

01. බී. එම්. කනුෂ්කා තරින්දි මහත්මිය 2011.01.16 දින සිට ස්ථිර සේවයේ පිහිටුවන ලෙසටත්,

02. එච්. ජී. ඒ. අයි. ප්‍රසාදි මහත්මිය 2009.10.15 දින සිට ස්ථිර සේවයේ පිහිටුවන ලෙසටත්,

03. ඩබ්. එස්. එන්. සුරංගිකා මහත්මිය 2009.11.01 දින සිට ස්ථිර සේවයේ පිහිටුවන ලෙසටත්,

04. ඩබ්. ජේ. ආර්. ප්‍රනාන්දු මහතා 2010.01.01 දින සිට ස්ථිර සේවයේ පිහිටුවන ලෙසටත්,

තවද, ඉහත නම සඳහන් සේවක සේවිකාවන් හට ගෙවීමට ඇති සියලුම ගෙවීම වන එනම් හිඟ වැටුප්, වෛද්‍යාධාර දීමනා, අනෙකුත් දීමනා, දිරිදීමනා අසනීප නිවාඩු සඳහා වන දීමනා සහ

ලාභාංශ ගෙවීම් ඇතුළු සියලුම හිඟ වැටුප් සහ දීමනා පහත පරිදි ගෙවන ලෙසට මෙයින් නියම කරමි :

01. බී. එම්. කනුෂ්කා තරින්දි මහත්මිය 2011.01.16 දින සිට 2020.11.20 දින දක්වා හිඟ මුදල් රුපියල් දෙලක්ෂ පනස් දෙදහස් තුන්සිය තිස්දෙකයි ශත හැත්තෑ තුන (රු. 252,332.73) ක මුදලක් ද

02. එච්. ජී. ඒ. අයි. ප්‍රසාදි මහත්මිය 2009.10.15 දින සිට 2020.11.20 දින දක්වා හිඟ මුදල් රුපියල් තුන්ලක්ෂ අනූහතර දහස් තුන්සිය අනූඅට (රු. 394,398/-) ක මුදලක් ද

03. ඩබ්. එස්. එන්. සුරංගිකා මහත්මිය 2009.11.01 දින සිට 2020.11.20 දින දක්වා හිඟ මුදල රුපියල් තුන්ලක්ෂ අසූදහස් දෙකයි ශත පනස් එක (රු. 380,002.51) ක මුදලක් ද

04. ඩබ්. ජේ. ආර්. ප්‍රනාන්දු මහතා 2010.01.01 දින සිට 2020.11.20 දින දක්වා හිඟ මුදල් රුපියල් තුන්ලක්ෂ හැත්තෑ පන්දහස් තුන්සිය එකොලහයි ශත හය (රු. 375,311.06) ක මුදලක් ද

තවද, ඉහත නම් සඳහන් සේවකයන් වෙත ගෙවන ලද හිඟ වැටුප්වලට අදාළ සේවක අර්ථසාධක අරමුදල සඳහා වන දායක මුදල් සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා වන අරමුදල් නිසි පරිදි අදාළ ආයතන වෙත ගෙවීමටද මෙයින් නියම කරමි.

තවද මෙම ප්‍රදානයේ සඳහන් හිඟ මුදල් 2021.02.18 දින මෙම බේරුම්කරණ විනිශ්චය සභාව ඉදිරියේ දී ගෙවීමට හා එම මුදල් ලබා ගැනීමට දෙපාර්ශවයේම එකඟත්වය පලවූයෙන් අදාළ මුදල් නියමිත දිනට ගෙවන ලෙසට නියම කිරීමෙන් අනතුරුව එම මුදල් 2021.02.18 දින ගරු බේරුම්කරු වන මා ඉදිරියේදී ගෙවූ බවට මෙයින් සහතික කරමි.

01. බී. එම්. කනුෂ්කා තරින්දි මහත්මිය 2011.01.16 දින සිට 2020.11.20 දින දක්වා හිඟ මුදල් රුපියල් දෙලක්ෂ පනස් දෙදහස් තුන්සිය තිස්දෙකයි ශත හැත්තෑ තුනයි (රු. 252,332.73). මෙම මුදලට අදාළව මුද්දර ගාස්තු වශයෙන් රුපියල් විසි පහක (25/-) මුදලක් අඩු කිරීමෙන් පසු රුපියල් තුන්ලක්ෂ පනස් දෙදහස් තුන්සිය හතයි ශත හැත්තෑ තුන (රු. 352,307.73) ක් වටිනාකමින් යුත් හලාවත ලංකා බැංකු ශාඛාවේ 2021.02.17 දින දරන අංක 766580 දරන චෙක්පත අද දින මා ඉදිරිපිටදී භාරදීමෙන් අනතුරුව එය නිවැරදි බවට පිළිගෙන භාර ගන්නා ලදී.

02. එච්. ජී. ඒ. අයි. ප්‍රසාදි මහත්මිය 2009.10.15 දින සිට 2020.11.20 දින දක්වා හිඟ මුදල් රුපියල් තුන්ලක්ෂ අනූහතර දහස් තුන්සිය අනූඅටයි (රු. 394,398/-). මෙම මුදලට අදාළව මුද්දර ගාස්තු වශයෙන් රුපියල් විසිපහක (25/-) මුදලක් අඩු කිරීමෙන් පසු රුපියල් තුන්ලක්ෂ අනූහතර දහස් තුන්සිය හැත්තෑතුනක් (රු. 394,373/-) ක් වටිනාකමින් යුත් හලාවත ලංකා බැංකු ශාඛාවේ 2021.02.17 දින දරන අංක 766577 දරන චෙක්පත අද දින මා ඉදිරිපිටදී භාරදීමෙන් අනතුරුව එය නිවැරදි බවට පිළිගෙන භාරගන්නා ලදී.

03. ඩබ්. එස්. එන්. සුරංගිකා මහත්මිය 2009.11.01 දින සිට 2020.11.20 දින දක්වා හිඟ මුදල රුපියල් තුන්ලක්ෂ අසූදහස් දෙකයි ශත පනස් එකයි (රු. 380,002.51). මෙම මුදලට අදාළව මුද්දර ගාස්තු වශයෙන් රුපියල් විසිපහක (25/-) මුදලක් අඩුකිරීමෙන් පසු රුපියල් තුන්ලක්ෂ හැත්තෑනවදහස් නවසිය අනූහතයි ශත පනස් එකක් (රු. 379,997.51) ක් වටිනාකමින් යුත් හලාවත ලංකා බැංකු ශාඛාවේ 2021.02.17 දින දරන අංක 766578 දරන චෙක්පත අද දින මා ඉදිරිපිටදී භාරදීමෙන් අනතුරුව එය නිවැරදි බවට පිළිගෙන භාරගන්නා ලදී.

04. ඩබ්. ජේ. ආර්. ප්‍රනාන්දු මහතා 2010.01.01 දින සිට 2020.11.20 දින දක්වා හිඟ මුදල් රුපියල් තුන්ලක්ෂ හැත්තෑ පන්දහස් තුන්සිය එකොළහයි ශත හයයි (රු. 375,311.06). මෙම මුදලට අදාළව මුද්දර ගාස්තු වශයෙන් රුපියල් විසිපහක (25/-) මුදලක් අඩුකිරීමෙන් පසු රුපියල් තුන්ලක්ෂ හැත්තෑපන්දහස් දෙසිය අසූහයයි ශත හයක් (රු. 375,286.06) ක් වටිනාකමින් යුත් හලාවත ලංකා බැංකු ශාඛාවේ 2021.02.17 දින දරන අංක 766579 දරන චෙක්පත අද දින මා ඉදිරිපිටදී භාරදීමෙන් අනතුරුව එය නිවැරදි බවට පිළිගෙන භාරගන්නා ලදී.

ඒ අනුව පහත පරිදි මාගේ අවසාන ප්‍රදානය මෙසේ සටහන් කරමි.

01. මාගේ ප්‍රදානයේ දෙවැනි කොටස දැනටමත් ක්‍රියාත්මක කර අවසන් කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියා කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගින බවද,

02. මාගේ ප්‍රදානයේ පළමු කොටස වන සේවකයන් හට පහත සඳහන් පරිදි නියමිත දින සිට බලපැවැත්වෙන පරිදි පත්වීම් ලිපි පෙරදාතම්කර ලබා දෙන ලෙසටත්,

01. බී. එම්. කනුෂ්කා තරින්දි මහත්මිය 2011.01.16 දින සිට බල පැවැත්වෙන පරිදි ස්ථිර සේවයේ පිහිටුවන ලෙසටත්,

02. එච්. ජී. ඒ. අයි. ප්‍රසාදි මහත්මිය 2009.10.15 දින සිට බල පැවැත්වෙන පරිදි ස්ථිර සේවයේ පිහිටුවන ලෙසටත්,

03. ඩබ්. එස්. එන්. සුරංගිකා මහත්මිය 2009.11.01 දින සිට බල පැවැත්වෙන පරිදි ස්ථිර සේවයේ පිහිටුවන ලෙසටත්,

04. ඩබ්. ජේ. ආර්. ප්‍රනාන්දු මහතා 2010.01.01 දින සිට බලපැවැත්නෙ පරිදි ස්ථිර සේවයේ පිහිටුවන ලෙසටත්, නියම කරමි.

එමෙන්ම අදාළ පත්වීම් ලිපි මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළ කරන ලද දින සිට මාස තුනක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබාදීමට කටයුතු කරන ලෙසටත් මෙයින් නියම කරමි.

03. මාගේ ප්‍රදානයේ තුන්වන කොටස වන සේවකයන් හට ගෙවන ලද හිඟ වැටුප්වලට අදාළ සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළකරන ලද දිනයේ සිටම මාස තුනක් ඇතුළත ගෙවා අවසන් කරන ලෙසටත් මෙයින් නියම කරනු ලබන අතර ඉහත ප්‍රදානයේ නියමයන් සම්පූර්ණය කර ඒ බව හලාවත සහකාර කම්කරු කොමසාරිස් වෙත වාර්තා කරන ලෙසට ද මෙයින් නියම කරමි.

මෙය සාධාරණ යහ යුක්ති සහගත ප්‍රදානයක් බවට තීරණය කරමි.

ඕබඩගේ ලීලාරත්න,
බේරුම්කරු.

2021 මාර්තු මස 15 වැනි දින.

11 - 603